**වාවකච්චේරි නගර සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 15 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 31 දින සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වාවකච්චේරි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි කාලයේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) රු. 2,375,313 ක් වටිනා යන්ත්‍ර 67 ක්, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබූ නමුත් භෞතිකව දක්නට නොවීය. මේ නිසා සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් වත්කම්වල වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි කාලයේදී පොත්වලින් කපා හැරීමට කටයුතු කෙරෙන බව කාරුණිකව දන්වා සිටිමි. | භෞතික වශයෙන් දක්නට නොමැති යන්ත්‍රවල වටිනාකම ලේඛනවල ගැලපීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | රු.1,687,954 ක් වටිනා මෝටර් රථ 23 ක්, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබූ නමුත් භෞතිකව දක්නට නොවීය. මේ නිසා සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් වත්කම්වල වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි කාලයේදී පොත්වලින් කපා හැරීමට කටයුතු කෙරෙන බව කාරුණිකව දන්වා සිටිමි. | භෞතික වශයෙන් දක්නට නොමැති මෝටර් රථවල වටිනාකම ලේඛනවල ගැලපීමට කටයුතු කළ යුතු වේ. |
| (iii) | රු.701,391 ක් වටිනා ලී බඩු 1,097 ක සංඛ්‍යාවක්, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබූ නමුත් භෞතිකව දක්නට නොවීය. මේ නිසා සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් වත්කම්වල වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි කාලයේදී පොත්වලින් කපා හැරීමට කටයුතු කෙරෙන බව කාරුණිකව දන්වා සිටිමි. | භෞතික වශයෙන් දක්නට නොමැති ලීබඩුවල වටිනාකම ලේඛනවල ගැලපීමට කටයුතු කළ යුතු වේ. |
| (iv) | රු.1,066,181 ක් වටිනා පුස්තකාල පොත් 4,682ක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබූ නමුත් භෞතිකව දක්නට නොවීය. මේ නිසා සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් වත්කම්වල වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි කාලයේදී පොත්වලින් කපා හැරීමට කටයුතු කෙරෙන බව කාරුණිකව දන්වා සිටිමි. | භෞතික වශයෙන් දක්නට නොමැති පොත්වල වටිනාකම ලේඛනවල ගැලපීමට කටයුතු කළ යුතු වේ. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නගර සභා මූල්‍ය රීති මාලාවේ III පරිච්ඡේදයේ 54 (2) වගන්තිය | හිඟ වරිපනම් බදු රු. 12,021,965 ක් ගෙවීම පැහැර හැරී පුද්ගලයන්ට සභාපතිවරයා විසින් වරෙන්තු නිකුත් කර නොතිබුණි. | සියළුම දේපළ වෙනුවෙන් වරෙන්තු නිකුත් කිරිමට කටයුතු කරමින් පවතී. | නගර සභා මූල්‍ය රීතීන්වලට අනුකූලව හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 371 | සභාව විසින් ලබාදුන් අත්තිකාරම් රු. 19,290 ක් මේ දක්වා නිරවුල් කර නොතිබුණි. | අයකිරිමට කටයුතු කරමින් පවති. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිරවුල් කිරිමට නියමිත ක්‍රියාමාර්ග යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක් ඉක්ම වූ කොන්ත්‍රාත් ඇප, ආරක්ෂිත තැන්පතු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඇප මුදල් ලබාගන්නා ලෙසට අදාල කොන්ත්‍රාත්කරුට ලිපි යවා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිරවුල් කිරීමට නියමිත ක්‍රියාමාර්ග යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.41,902,170 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 15,145,188 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,735,000 | 7,095,438 | 12,021,965 | 6,936,400 | 7,053,963 | 11,824,334 |
| කුලී | 23,637,200 | 25,412,400 | 1,019,764 | 14,314,200 | 26,854,257 | 831,479 |
| බලපත්‍ර ගාස්තු | 831,000 | 939,291 | 500 | 806,100 | 872,031 | 1,500 |
| වෙනත් ආදායම් | 76,673,056 | 83,701,732 | 9,220,496 | 91,362,000 | 50,776,185 | 9,053,738 |
| | 107,876,256 | 117,148,861 | 22,262,725 | 113,418,700 | 85,556,436 | 21,711,051 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් හිඟ වරිපනම් බදු රු. 12,021,965 ක් අයකර නොතිබුණි. | හිඟ මුදල් ඇතුළත් කර වරිපනම් බදු තක්සේරු නිවේදන නිකුත් කරමින් පවතී. | හිඟ මුදල් නියමිත කාලයේදී අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**2.2.3 කුලී**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ හිඟ කඩ කුලී රු. 345,804 ක් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවකි. | හිඟ කඩ කුලී හිඟ මුදල් නියමිත කාලයේදී අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**2.2.5 බලපත්‍ර ගාස්තු**

**(අ) කර්මාන්ත බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ රු.300,000 ක් වටිනා සන්නිවේදන කුළුණු බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත. | සන්නිවේදන කුළුණු බලපත්‍ර ගාස්තු නියමිත කාලයේදී අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**(ආ) වෙළෙඳ බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ හිඟ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු රු. 428,250 ක් වටිනා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකිරීම් සිදුකිරීමට කටයුතු කරමින් පවති. | හිඟ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු නියමිත කාලයේදී අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**(ඇ) අනෙකුත් ආදායම්**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අනෙකුත් හිඟ ආදායම් රු. 11,409 ක් වටිනා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ක්‍රියාමාර්ග ගනු ලැබේ. | අනෙකුත් හිඟ ආදායම් නියමිත කාලයේදී අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**2.2.6 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු. 6,434,683 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. | මුදල් අයකර ගැනීමට අදාල ක්‍රියාමාර්ග ගනිමින් පවති. | හිඟ මුද්දර ගාස්තු නියමිත කාලයේදි අයකිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

මහනගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව, මහජන සෞඛ්‍යය, මහජන උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත් සහ මහජන සුවය පහසුකම් සහ සුහසාධනය ආදී සභාවෙන් ඉටුකළ යුතුව තිබූ කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය ප්‍රකාරව, 2019 දෙසැම්බර් 31 දින වන විටත් මූලික කරුණු 15 ක් සඳහාම අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කර නොතිබුණි. | පිළියෙල කිරීම සඳහා ක්‍රියාමාර්ග සිදු කරමින් පවති. | අදාළ ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වේ. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | පිළිසරු ව්‍යාපෘතියෙහි වූ ඇඹරීමේ යන්ත්‍ර සවි නොකර පැවතුණි. | යන්ත්‍ර සවිකිරීමට කටයුතු කරමින් පවති. | යන්ත්‍ර සවි කළ යුතු වේ. |
| (ii) | අපද්‍රව්‍ය එකතු කර වෙන්කර තිබුණත්, ඒවා ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලියට භාජනය කර නොතිබුණි. | විකිණීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණයට භාජනය කළ යුතු වේ. |
| (iii) | නගර සභාව විසින් ඝන අපද්‍රව්‍ය කාර්යයෙහි නිරතවන සෞඛ්‍ය කම්කරුවන් 30දෙනා වාර්ෂික වෛද්‍ය පරීක්ෂණයන්ට යොමු කර නොතිබුණි. | මෙම වර්ෂයේ සිට සෞඛ්‍ය කම්කරුවන් සඳහා වෛද්‍ය පරීක්ෂණයන්ට යොමු කිරීමට කටයුතු කර ඇත. | පවිත්‍ර කිරීමේ කාර්යයේ නිරතවන සෞඛ්‍ය කම්කරුවන්ව වෛද්‍ය පරීක්ෂණයන්ට යොමු කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (iv) | නගර සභාව විසින් ලබාදිය යුතු අත්‍යාවශ්‍ය සේවාවක් වන මලඅපද්‍රව්‍ය බැහැරකිරීම සිදු නොකර තිබීම හේතුවෙන් මහජනතාව අසීරුතාවයට පත්වී තිබුණි. | මෙම කාර්යය නැවත ආරම්භ කිරීම සම්බන්යෙන් යාපනය දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් විමසීම් කර ඇත. | අත්‍යාවශ්‍ය සේවාවක් වන මලඅපද්‍රව්‍ය බැහැරකිරීම සිදු කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර තැන්පතු මුදල් රු.73,604,622ක් නගර සංවර්ධන කාර්යයන් සඳහා යොදවා නොගෙන බැංකුවේ තැන්පත් කර තිබුණි. | නගර සභාව විසින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. | සභාවේ අරමුදල් නගර සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | නීතිවිරෝධී ගොඩනැගිලි සම්බන්යෙන් සභාව විසින් අධිකරණයේ නඩු පවරා තිබූ බව නිරීක්ෂණය වූ නමුත්, ඇති විය හැකි බැරකම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2019 වර්ෂ අවසානයේ නඩු පැවරීම සිදුවීම හේතුවෙන් පූර්ව අරමුදල් ප්‍රතිපාදන වෙන්කිරීම් සිදු කළ නොහැකි විය | සභාව විසින් පැවරූ නඩු සම්බන්යෙන් අපේක්ෂා කරන වටිනාකම්වල විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |
| (ඇ) | සභාවට එරෙහිව පවරනු ලැබූ නඩු විභාග වෙමින් පවතින නමුත් වියදම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ආදායම් හා වියදම් ගිණුමේ ඇතුළත් කර ඇත. | පැවරූ නඩු සම්බන්ධ වියදම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |
| (ඈ) | සභාව සතු කඩකාමර 38ක් වර්ෂ 07 සිට 40ක් දක්වා කුලී ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් අළුත් නොකළ කඩකාමර සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. | කුලී ගිවිසුම් කාලයෙන් කාලයට අළුත් කිරීමට කටයුතු කළ යුතුවේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**(අ) තනතුරු පුරප්පාඩු සහ අතිරික්තයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් මානව සම්පත් විධිමත් අයුරින් ලබාගෙන නොයෙදවීම නිසා, එවැනි මානව සම්පත් 25 ක් විසින් ඉටු කළයුතු සේවාවන් ප්‍රමාද වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ලිපි යවනු ලැබ ඇත. | තනතුරු පුරප්පාඩු නියමිත කාලයේදී පිරවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

(ආ) සේවක ණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මියගිය, සේවය අත්හිටවූ නිලධාරීන් 04දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය හිඟ ශේෂ රු. 88,478 ක් අයකිරීම සඳහා සභාව විසින් පසුගිය වර්ෂ 08 ක කාලයක සිට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. | හිඟහිටි සේවක ණය නිසි කාලයේදී අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වරිපනම් බදු අයකිරීම සඳහා වාර්ෂිකව සභාව විසින් දේපල හිමියන්ට "K" ආකෘති පත්‍ර ලබාදිය යුතු වුවත්, 2019 වර්ෂයේ දේපල 3,197 ක් සඳහා "K" ආකෘති පත්‍ර බෙදාහැර නොතිබුණි. | දේපළහිමියන් හඳුනාගත නොහැකිවීම හේතුවෙන් හිඟමුදල් අයකිරීමේ දුෂ්කරතාවන් මතුවී ඇත. | හිඟ දේපල බදු අයකිරීමට K ආකෘති පත්‍ර ලබාදීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අංක NPJP – 8201, NPJS – 7934 ආදි වාහන හානියට පත් වි තිබු නමුත් සභාව විසින් අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත. | වාහන සඳහා නඩත්තු හා අලුත්වැඩියාවන් නියමිත කාලවලදී සිදුකළ යුතු වේ. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ අයවැය ඇස්තමේන්තුවේ වියදම් හා තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයක් නිරීක්ෂණය වීම නිසා මෙය ඵලදායී නොවූ අයවැයක් ලෙස දක්නට ලැබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |